ශ්‍රී ලංකාවේ 69 වන නිදහස් දින සංවත්සරය නිමිත්තෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මංගල සමරවීර මැතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව සිය 69 වන නිදහස් දිනය සමරන මොහොතේ සියළුම ශ්‍රී ලාංකිකයන්ටත්, ලොව පුරා වෙසෙන හා සේවය කරන ශ්‍රී ලාංකික සම්භවයක් සහිත සියළුම පුද්ගලයන්ටත් මම උණුසුම් සුභ පැතුම් පළකරමි.

1948 පෙබරවාරි මස 04 වන දිනෙන් ඇරඹී අප ජාතියේ ගමන් මග අප හට ආඩම්බර විය හැකි ජයග්‍රහණවලින් හා කටුක වේදනාවන් හා සන්තාපයන් මුසු වූ අභියෝගයන්ගෙන් යුක්ත විය.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මූලිකත්වයෙන් ජාතික ආණ්ඩුවක් නිර්මාණය කිරීම උදෙසා ගන්නා ලද තීරණාත්මක පියවර ඔස්සේ, යහපාලනය, නීතියේ ආධිපත්‍ය, පුද්ගල අයිතීන්, යුක්තිය, නිදහස හා සියළු දෙනාගේ අභිමානය සහතික කරන, අප රටේ පවතින බහු වාර්ගික, බහු සංස්කෘතික හා බහු ආගමික ස්වභාවය ආශිර්වාදයක් කොට ගනිමින්, සියළුම ආකාරයේ වෙනස්කොට සැළකීම් හෙළා දකිමින් ශක්තිමත් ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක් වශයෙන් අපගේ ජාතියේ අභිවෘද්ධිය සහතික කිරීමට අවශ්‍ය ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හා රට තුළත් ලෝකය සමඟත් සාමකාමීව කටයුතු කරන සියළු දෙනාගේ සුභ සිද්ධිය උදෙසා ජාත්‍යන්තරය සමඟ සහයෝගීව කටයුතු කරන සාධාරණ ආර්ථික සංවර්ධනයක් සහිත ශක්තිමත් ජාතියක් ගොඩ නැඟීමට අපි පියවර ගනිමින් සිටින්නෙමු.

අප විසින් අප උදෙසාම තොරා ගන්නා ලද මෙම මාවත අභියෝගාත්මක වූවකි. ජාතිය ගොඩ නැංවීම සඳහා ශ්‍රී ලංකාව තුළ හා ශ්‍රී ලංකාවෙන් පිටත වෙසෙන සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ කැපවීම අත්‍යාවශ්‍ය වේ.

අප රට නිදහස ලැබීමෙන් 70 වෙනි වසරට පියමනින මේ මොහොතේ, සංහිඳියාව හා සාමයෙන් යුතු පරිපූර්ණ, සමෘද්ධිමත් ජාතියක් ගොඩ නැංවීම සඳහා ඔබගේ ශක්තීන්, ඔබගේ හොඳ හිත, ඔබගේ ජවය, දක්ෂතා හා ඥානය යෙදවීමට මෙම ඓතිහාසික මොහොත අවස්ථාවක් කර ගන්නා ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි. එබැවින් එක් පවුලක සහොදර සහෝදරියන් ලෙස, සියළු දෙනාට ගරු කරමින්, නැවත ගැටුම් ඇති නොවන බවට සහතික වෙමින්, අපගේ ප්‍රාර්ථනීය ශ්‍රී ලංකාව ගොඩනැංවීම උදෙසා ආඩම්බර ජාතියක් ලෙස එක්ව ඉදිරියට ගමන් කිරීමට අපි සියළු දෙනා අදිටන් කර ගනිමු.

මංගල සමරවීර, පා.ම.
විදේශ කටයුතු අමාත්‍ය